**කළුතර නගර සභාව - 2022**

**--------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

කළුතර නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කළුතර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතයේ පරිච්ජේද අංක 3.27 සිට 3.32 ජේදයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කර නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ න්‍යාය හා නොගැළපුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංඛ්‍යාත්මක බලපෑමක් වී නැති බව | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම පිළිවෙලින් රු.24,017,493 ක් හා රු.21,705,750 ක් වුවත්, පොලී ආදායම රු.24,288,709 ක් ලෙස එනම් රු.271,216 ක් වැඩියෙන්ද, ලැබිය යුතු පොලී ආදායම රු.21,066,667 ක් ලෙස එනම් රු.639,083 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි | 2023 වර්ෂයේ ගිණුම පිළියෙල කිරිමේදී නිවැරදි කරන බව | උපචිත පදනමට ආදායම ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.34,345,527 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.40,481,432ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 42,552,200 | 43,787,063 | 48,773,656 | 31,478,437 | 40,751,000 | 41,249,783 | 28,800,619 | 36,249,409 |
| (ii) | කුලී | 19,259,900 | 14,233,583 | 10,717,823 | 398,700 | 13,475,000 | 8,068,319 | 8,777,469 | 256,849 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,276,000 | 2,454,024 | 2,453,374 | - | 200,000 | 559,266 | 559,266 | - |
| (iv) | වෙනත් ආදායම් | 208,261,900 | 235,215,781 | 168,382,886 | 81,066,667 | 2,127,000 | 2,759,655 | 2,762,655 | 19,800 |
| | | 272,350,000 | 295,690,451 | 230,327,739 | 112,943,804 | 56,553,000 | 52,637,023 | 40,900,009 | 36,526,058 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02-03 කාලයක සිට පැවත එන හිඟය රු.4,290,844 ක්ද, වර්ෂ 03-05 අතර හිඟය රු.1,887,185 ක්ද, වර්ෂ 05-10 අතර හිඟය රු.1,297,440 ක්ද, හා වර්ෂ 10 යට වැඩි හිඟය රු.205,517 ක් ද විය. | වරිපනම් ආදායම් අය කිරිමට කටයුතු කරමින් පවතින බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.60,000,000 ක් විය. | 2023 වර්ෂය තුල රු.9,294,230 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇති බව | හිඟ මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ අළුත්වැඩියාව සඳහා භාරදී තිබූ විදුලි ජනක යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, අළුත්වැඩියා කර සභාවට භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියාවේ අවසාන අදියරේ පවතින බැවින් කඩිනමින් සභාවට ගෙන්වා ගැනීමට කටයුතු කරන බව | සභාවේ වත්කම් නියමිත කාල සීමාවන් තුල අළුත්වැඩියා කර නැවත භාර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 සැප්තැම්බර් 23 දින අළුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත භාර දෙන ලද ඉසුසු ලොරි රථයේ එන්ජිම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, අළුත්වැඩියා කර සභාවට භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියාවේ අවසාන අදියරේ පවතින බැවින් කඩිනමින් සභාවට ගෙන්වා ගැනීමට කටයුතු කරන බව | සභාවේ වත්කම් නියමිත කාල සීමාවන් තුල අළුත්වැඩියා කර නැවත භාර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභිකයින් සඳහා පාඨමාලා හැදෑරීම සඳහා 1988 නගර සභා ආඥා පනතේ විධිවිධාන සලසා නොතිබියදී සහ අනුමැතිය මත සභිකයින් තිදෙනෙක් සඳහා 2020 වර්ෂයේ රු.74,500 ක්ද, සමාලෝචිත වර්ෂයේ එක් සභිකයෙක් සඳහා රු.20,000 ක්ද ලෙස අදාල පුහුණු කිරීමේ ආයතන සඳහා ගෙවීම් කර තිබුණි. | එක් සභිකයෙකුට අවසන් පරික්ෂණයට නැවත පෙනී සිටීමට සිදු වීමෙන් හා තවත් සභිකයෙකුට මෙතෙක් පාඨමාලාව නිම කිරීමට නොහැකි වීමෙන් සහතික ඉදිරිපත් කිරීමට නොහැකි විය. | නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුල ඍජු ශ්‍රම පදනම මත සභා අනුමැතියකින් තොරව සභාවට අයත් නොවන මීටර් 64 ක් දිග හා මීටර් 3.65 ක් පළල පිලිප්නේරි පල්ලියේ අභ්‍යාන්තර මාර්ගය තාර දමා සංවර්ධනය කර තිබුණි. | නගර සීමාවේ පිහිටි පොදු මාර්ගයන් නිත්‍යානුකුලව අළුත්වැඩියා කර ඇති බව. | සභාවට අයත් නොවන මාර්ග සංවර්ධනය නොකළ යුතුය. |
| (ඈ) ලේකම්ගේ සහ ගබඩා භාර නිලධාරිගේ අත්සන් රහිත හා දින රහිත අංක 2174 දරන නිකුත් කිරීම් නියෝගය මගින් විධිමත් අනුමැතියකින් හා අධීක්ෂණයකින් තොරව මෙම ව්‍යාපෘතිය සඳහා ගබඩාවෙන් අමුද්‍රව්‍ය ලබාගෙන තිබුණි. | භාණ්ඩ ඉල්ලුම් කර ඇත්තේ සභාපතිතුමා වන අතර භාණ්ඩ ලබාගෙන ඇත්තේ එවකට වැඩ පරිපාලක මහතා විසින් බව. | විධිමත් අනුමැතියක් නොමැතිව ගබඩාවෙන් භාණ්ඩ ලබා දීම නොකළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර කිහිපයක සිට ක්‍රියා විරහිතව පවතින බෙල් යන්ත්‍රය සමාලෝචිත වර්ෂය තුලදී ද අළුත්වැඩියා කර නොතිබුණි. | අමතර කොටස් සොයා ගැනීමේ අපහසුව නිසා අළුත්වැඩියා කිරිමට නොහැකි වූ අතර 2023 වර්ෂයේ අළුත්වැඩියා කරන බව. | සභාවේ වත්කම්වලින් උපරිම ප්‍රයෝජනය ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 03 ක් අළුත්වැඩියාව සඳහා යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර නොතිබුණි. | අමතර කොටස් සොයා ගැනීමේ අපහසුව නිසා අළුත්වැඩියා කිරිමට නොහැකි වූ අතර 2023 වර්ෂයේදී අළුත්වැඩියා කරන බව. | වාහන අළුත්වැඩියා කර උපයෝජනය කළ යුතුය. |
| (ආ) | යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ අනුව සභාව සතු වාහන 04 ක් අළුත්වැඩියා කිරිම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බව සඳහන් වුවත්, ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | වාහන 02 ක් අළුත්වැඩියා කිරිම ඵලදායි නොවන අතර ඉතිරි වාහන 02 හි වැසි අංක සොයා ගත නොහැකි බව. | අළුත්වැඩියා කිරීම ඵලදායි නොවන වාහන අපහරණය කළ යුතුය. |
| (ඇ) | නගර සභාව සතු වාහන 03 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | මෙම වාහන 03 අළුත්වැඩියා කිරිම ආර්ථික වශයෙන් ඵලදායි නොවන නිසා මෝටර් රථ දෙපාර්තමේන්තුව දැනුවත් කර වාහනය ස්ක්‍රැප් වශයෙන් විකිණීමට කටයුතු කරන ලෙස යාන්ත්‍රික ඉංජිනේරු දන්වා ඇති බව. | සුන්බුන් ලෙස විකිණීමට ප්‍රථම සභාව සතු වාහන, සභාව නමින් ලියා පදිංචි කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ඔක්තෝබර් 05 දිනැති නිකුත් කිරීම් නියෝග 242 හි අයිතම අංක 06 යටතේ මාර්ගයේ දෙවන වර තාර ආලේප කිරීම සඳහා බැරල් 04 ක් ලබාගෙන තිබුණද, මාර්ගයේ දෙවන වර තාර ආලේප කර නොතිබූ අතර අදාල බැරල් 04 ද වැඩ පාලක භාරයේ නොතිබුණි. | නිකුත් කිරීම් නියෝග 242 හි අයිතම අංක 06 යටතේ දෙවන වර තාර ආලේපනය සඳහා තාර බැරල් 04 ක් ලබා ගෙන තිබුණු බව. | සම්පත් අවභාවිතා නොකළ යුතුය. |